රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 08/99

මගේ අංකය :ආ/IV/6/27(II)
/ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ-07.

1999.03.18

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත.

**<u>රාජ්‍ය ආයතන තුළ දුම් පානය තහනම් කිරීම</u>**

දුම්කොල, මත්පැන් හා නීතිවිරෝධී මත්ද්‍රව්‍ය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ සැලකිල්ලට ගනිමින් පහත සඳහන් පරිපාලනමය විධිවිධාන වහාම ක්‍රියාත්මක කළයුතු බවට තීරණය කර ඇත

(I) සියළුම රාජ්‍ය ආයතන තුල දුම්බීම තහනම් කළයුතුය.

(II) එම ආයතනවලට අයත් ආපනශාලාවල දුම්වැටි, දුම්කොල සහිත භාණ්ඩ අලෙවිය නැවැත්විය යුතුය.

(III) දුම්බීමට පොළඹවන කිසිදු ආකාරයක ප්‍රචාරයකට රාජ්‍ය ආයතන පරිශ්‍රයන් තුළ ඉඩ නොදිය යුතුය.

(IV) දුම්බීමට අනුබල දෙන කිසිවකුගේ අනුග්‍රහයක් රාජ්‍ය ආයතනයකට ලබා නොගත යුතුය.

02. ඉහත විධිවිධානයන්ට අනුකූලව ක්‍රියා කිරීමට කරුණාකර පියවර ගනු මැනවි.

**පී.ඒ. සේනාරත්න**
ලේකම්
රාජ්න පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර!මාන්ත අමාත්‍යාංශය